**ශීර්ෂය 275 - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 275 - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2009 මැයි 06 දිනැති අංක 1600/18 හා 2021 පෙබරවාරි 25 දිනැති අංක 2216/34 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් රජයේ ඉඩම්වල ඛණිජ ද්‍රව්‍ය එකතු කිරීමේ ගාස්තු වශයෙන් 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා අයවිය යුතු මුදල රු. 139,553,409 ක් විය. | මේ පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් විමසා ඇත. | 2009 මැයි 06 දිනැති අංක 1600/18 හා 2021 පෙබරවාරි 25 දිනැති අංක 2216/34 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- | --- |
| | | රු. | | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූල නොවීම් | | | | |
| | XXIV පරිච්ඡේදයේ 4.4, 4.5 හා 4.6 ඡේද | 2,103,613 | විශ්‍රාම ගිය, සේවය හැර ගිය, මියගිය හා වැඩ තහනමට ලක් වූ නිලධාරීන් 11 | අයකර ගැනීමට කටයුතු සිදුකරමින් පවතින බව දන්වා ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | කගෙන් අයවිය යුතු ණය ශේෂ එකතුව රු. 2,103,613 ක් වුවද, එම ශේෂයන් අයකර ගැනීමට 2022 දෙසැම්බර් 31 දක්වා කටයුතු කර නොතිබුණි. | | කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයට අනුකූල නොවීම --------------------- | | | | |
| | මුදල් රෙගුලාසි 570 හා 571 | 308,795,923 | වර්ෂ 02 ක කාලය ඉක්මවූ රු. 308,795,923 ක් වටිනා පොදු තැන්පතු 292 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර ඒ අතරින් රු. 44,377,180 ක් වටිනා තැන්පතු වර්ෂ 05 කට අධික කාලයක සිට පොදු තැන්පතු, ගිණුම් වල පැවතුණි. | සුදුසු පරිදි නිරවුල් කිරීමට හා රාජ්‍ය ආදායමට ගැනීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි 570 හා 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | චක්‍රලේඛ විධිවිධාන, රෙගුලාසි හෝ මාර්ගෝපදේශ වලට අනුකූල නොවීම --------------------- | | | | |
| (i). | පරිසර අමාත්‍යාංශයේ අංක 01/2021 හා 2021 ජනවාරි 02 දිනැති චක්‍රලේඛය | - | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලෙකම් කාර්යාලය විසින් ග්‍රාමීය පරිසර කමිටු හා ප්‍රාදේශීය කමිටු පවත්වා නොතිබුණි. | සෑම ග්‍රාම නිලධාරී වසමකම ග්‍රාමීය හා ප්‍රාදේශිය පරිසර කමිටු පිහිටුවා සක්‍රීයව පවත්වාගෙනයාමට කටයුතු කර ඇති බව දිඹුලාගල, වැලිකන්ද හා තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දන්වා ඇත. | ග්‍රාමීය පරිසර කමිටු හා ප්‍රාදේශීය කමිටු පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.3 වංචනික ස්වරූපයේ ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇලහැර සමෘද්ධි බැංකුවට අයත් නිලධාරීන් 05 දෙනෙකු විසින් මුදල් අවභාවිතා කර ආයතන සංග්‍රහයේ පළමුවන උපලේඛනයට ඇතුළත් වරදක් සිදුකර තිබූ බව 2019 වර්ෂයේදී අනාවරණය වී ඇතත්, ඊට අදාළව විනයානුකූලව කටයුතු සිදුකර නොතිබූ අතර, එක් නිලධාරිනියකගෙන් තවදුරටත් අයකර ගත යුතු මුදල රු. 405,518 ක් විය. | එම නිලධාරිනියගෙන් අයකරගැනීමට ඇති මුදල අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙස දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකට දැනුම් දී ඇති බව සඳහන් කර ඇත. | අදාළ මුදල් අයකරගැනිමට හා අදාළ මූල්‍ය වංචා සිදුකළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2018 ජූනි 11 දින සිට 2021 මැයි දක්වා කාලය තුළ වැඩිහිටි දීමනා හා වකුගඩු දීමනා ගෙවීම් කිරීමේදී සිදුවී තිබූ රු.2,443,600 ක මූල්‍ය අක්‍රමිකතාවයට අදාළ නිලධාරියාගෙන් එම මුදල අයකර තිබුණද**,** ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ පළමු උපලේඛනය යටතේ වන වරදක් සිදුකර ඇතත් ඊට අදාළ විනයානුකූල පරීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකෙරුණි. | විනය බලධාරි වෙත යොමුකර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිබිදෙමු පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන මගින් ආනන්ද බාලිකා ජාතික පාසලේ පිහිනුම් තටාකය ඉදිකිරීම අදියර 2 යටතේ මූලික යටිතල පහසුකම් ඉදිකිරීම වෙනුවෙන් රු.5,911,185 ක ප්‍රතිපාදන වෙන් කර පැවතියද මූලික ඇස්තමේන්තුවට පරිබාහිරව අනුමැතිය රහිතව රු. 1,677,756 ක වැඩ කොටස් සිදුකර තිබූ අතර, ඇස්තමේන්තුවෙහි ඇතුළත් වැඩ වලින් ඉටුකර පැවතියේ රු. 644,338 ක් වටිනා වැඩ කොටසක් පමණක් විය. | ප්‍රතිපාදන නොමැතිවීම මත බිල්පත් සඳහා මුදල් ගෙවා නොමැති අතර, මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ඉදිරියේදී කිසිදු ගෙවීමක් සිදුනොකරනු ඇත. | මූලික ඇස්තමේන්තුවට පරිබාහිරව ඉටුකරගන්නා වැඩ වෙනුවෙන් පූර්ව අනුමැතියක් ලබාගත යුතු අතර, ව්‍යාපෘතියේ මූලික අරමුණු ඉටුවන අයුරින් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - 2021 යටතේ සත්ව පාලන කටයුතු සඳහා මසක් වයසැති කිකිළි පැටව් ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක ග්‍රාම නිලධාරි වසම් 42 ක් වෙත ලබාදුන් කිකිළි පැටවුන් 22,980 ක් අතරින් කිකිළි පැටවුන් 18,141 ක් එනම්, සියයට 79 ක ප්‍රතිශතයක් මියගොස් ඇති බැවින් ඒ සඳහා වැය කළ රු.7,357,027 ක මුදල නිෂ්කාර්යය වී තිබුණි. | විධිමත් පරීක්ෂණයක් සිදුකරන ලෙස අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. | විධිමත් පරීක්ෂණයක් සිදුකර අක්‍රමිකතාවයක් සිදුවී ඇත්දැයි පරික්ෂා කර නැවත සිදු නොවීමට කටයුතු කළ යුතුය. |

### 3.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිඹුලාගල ප්‍රාදේශීය බල ප්‍රදේශයට අයත් ගිවිසුම්ගත පිරිවැය රු.1,970,000 වූ පරණ පොල හන්දියේ විජයපුර කඩේ අසල සිට එෆ් සී ඇල දක්වා මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් 28 දින වන විට වැඩ නිම කළ යුතුව පැවති නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන | ඉදිරි වැඩ අවසන් කිරීම ගිවිසුම්ගත සංවිධානය විසින් පැහැර හැර ඇති බැවින් එම සංවිධානය අසාධු ලේඛනගත කිරීමට කටයුතු කරන බව හා | කාර්ය පැහැර හරින කොන්ත්‍රාත්කරු සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කළ යුතු අතර, ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිම කිරීමට කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | විටත් රු.1,470,209 ක් වූ වැඩ කොටස් ඉටු නොකර ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි. | මෙම මාර්ගය දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ ප්‍රතිපාදන මත ඉදිරියේදී වැඩ අවසන් කිරීමට සැලසුම් කර ඇත. | යුතුය. |
| (ආ) | ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කළ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන - 2021 යටතේ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අන්තර් බන්ධිත කුට්ටිගල් අතුරා මාර්ග සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.11,000,000 ක ඇස්තමේන්තු සකස් කර තිබූ ව්‍යාපෘති 06 ක් ගිවිසුම්ගත පරිදි 2021 දෙසැම්බර් 28 වන විට වැඩ නිම කල යුතුව පැවතුණු නමුත් රු.10,420,082 ක වැඩ කොටස් ඉටුනොකර ව්‍යාපෘතිය අත්හැර තිබුණි. | ඇස්තමේන්තු කිහිප විටක් සංශෝධනය කිරීම හා ඉදිකිරීම් ද්‍රව්‍ය මිළ ඉහළ යාම මෙයට හේතු වී ඇත. | කාර්ය පැහැර හරින කොන්ත්‍රාත්කරු සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කළ යුතු අතර, ව්‍යාපෘතියේ ඉතිරි වැය නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විජයරාජවැව පන් ආශ්‍රිත නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතියට 2021 වර්ෂයේදී රු. 4,105,000 වැය කර ඇතත් අරමුණුගත ව්‍යාපෘතිය ක්‍රියාත්මකව නොතිබුණි. | විදුලිය හා ජලය නොමැති බැවින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ නොහැකි වී ඇත. | ශක්‍යතා අධ්‍යනයක් සිදුකර අදාළ පාර්ශවයන් සමඟ ගිවිසුම්ගතව ව්‍යාපෘති ආරම්භ කළ යුතුය. |

**3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ දෙවන අදියර කාර්ය ඉටුකර ගැනීමේ කාලය හා මූලික පිරිවැය අවම කර ගැනීම යන කරුණු සඳහන් කරමින් මුල් කොන්ත්‍රාත්කරුටම ලබාදී තිබුණි. එහෙත් ගිවිසුම්ගත පිරිවැය රු. 952,900,012 ක් වූ දෙවන අදියර 2019 මැයි 31 වන දින වන විට අවසන් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් වර්ෂ 04 ක් පමණ ගතවී ඇතත්, අදාළ කාර්ය නිම කර නොතිබුණි. | රට මුහුණ දුන් වසංගත තත්ත්වය සහ අයහපත් මූල්‍ය තත්ත්වය මීට හේතු වී ඇත. | වගකීම් පැහැර හරින ලද පාර්ශවයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට හා ව්‍යාපෘතිය කඩිනමින් නිම කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොළොන්නරුව දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කරන ලද ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ පළමු අදියරේ සමිති 11 ක් හා දෙවන අදියරේ සමිති 45 ක් අක්‍රියව පවතින අතර, එම සමිති වෙත ලබාදී තිබූ එකතුව රු.14,685,474 ක් අදාළ බැංකු ගිණුම් වල නිශ්කාර්යව පැවතුණි. | ගිණුම්වල පවතින මුදල් ප්‍රාදේශීය ලේකම් වෙත පවරා ගැනීමට හෝ සක්‍රීය මට්ටමට ගෙන ආ හැකි සමිති වල අරමුදල් උපයෝජනය කිරීමට කටයුතු යොදා ඇත. | සමිති ක්‍රියාකාරි මට්ටමින් පවත්වා ගැනීමට කටයුතු කළ යුතු අතර, අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ 04 ක ගැමිදිරිය ජනතා සමාගම් 74 න් 49 ක් අක්‍රීය බවට තොරතුරු වාර්තා වී ඇති අතර, එම සමාගම් වලට අයත් බැංකු ගිණුම්වල රු. 24,728,866 ක මුදලක් නිශ්කාර්යව පැවතුණි. | අක්‍රීය සමිති වල අරමුදල් සක්‍රීය සමිති වෙත මාරු කිරීමට කටයුතු සිදුකරමින් පවතින බව දන්වා ඇත. | සමිති ක්‍රියාකාරි මට්ටමින් පවත්වා ගැනීමට කටයුතු කළ යුතු අතර,අවශ්‍ය තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් යාවත්කාලීනව පවත්වාගත යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා 2019/20 මහ, 2020 යල, 2020/21 මහ, 2021 යල කන්න සඳහා වී මෝල් හිමියන් විසින් ලබාගත් වී වෙනුවෙන් රජයට ලබා නොදුන් සහල් තොග ප්‍රමාණය කි.ග්‍රෑම්. 3,774,827 ක් බව ඉදිරිපත් කළ වාර්තා අනුව නිරීක්ෂණය වූ අතර, ඒ වෙනුවෙන් අය විය යුතු හිඟ මුදල රු.263,863,180 ක් විය. | හිඟ මුදල් අයකරමින් පවතින බව දන්වා ඇත. | රජයට ලැබිය යුතු සහල් තොග ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතියේ අදියර III හි සැලසුම වෙනස් කිරිමට හේතු සඳහන් නොකර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉල්ලීම මත රු. 7,755,930 ක අතිරේක වැඩ සිදුකර තිබුණි. | සැලැස්ම වෙනස් කිරීමට හේතු ඉදිරිපත් කර නොමැති බව උපදේශන සමාගම විසින් දන්වා ඇත. | සාධාරණ හේතූන් මත සැලසුම් සංශෝධනයන් සිදුකළ යුතුව ඇත. |
| (ඉ) | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත 1983 වර්ෂයේදී කුලී සින්න පදනම මත ලබාදී ඇති නිල නිවාස 17 ක ප්‍රාග්ධන වටිනාකම වර්ෂ 60 කින් ගෙවා නිමා වූ පසු දිස්ත්‍රික් | අදාල ගැටළුව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා දිසාපති සමුළුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇත. | නිවාස සංවර්ධන අධිකාරිය වෙත වැඩිපුර ගෙවා ඇති මුදල් අයකරගැනීමට හා නිවාස වල අයිතිය පවරාගැනීමට කටයුතු කළ යුතුය. |

ලේකම්/ ප්‍රාදේශීය ලේකම් වෙත එම නිවාස සින්නවීමේ පදනම මත ලබා දී තිබුණි. එසේ ලබාදුන් නිවාස 07 ක් (නිවාස සංවර්ධන අධිකාරියෙන් ලබාගත් තොරතුරු අනුව) 2021 ජූනි වන විට තක්සේරු වටිනාකම ඉක්මවා රු.215,226 ක් නිවාස කුලිගෙවා අවසන්ව ඇතත්, දිස්ත්‍රික් ලේකම් වෙත එම නිවස පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සමාලෝචිත වර්ෂය අවසාන වන විට තෘතික මට්ටමේ කාර්ය මණ්ඩල පුරප්පාඩු 12 ක්ද, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 147 ක්ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 06 ක්ද පැවතුණි. | ස්වදේශ කටයුතු අමාත්‍යංශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත වාර්තා කර ඇත. | සුදුසු පරිදි අදාළ පුරප්පාඩු සපුරාගැනීමට කටයුතු කළ යුතුය. |